සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - I

නම / විභාග අංකය :-........................................................ කාලය: පැය 02 යි

1 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. මනු ලොව උපත ලැබීමට ප්‍රථම අප මහා බෝසතාණෝ උපත ලබා සිටියේ,

(1) තුසිත දෙව් ලොවේය. (2) බ්‍රහ්ම ලොවේය.
(3) නාග භවනේය. (4) සක්‍ර භවනේය.

2. පංච මහා විලෝකනය හෙවත් පස් මහ බැලුම් වලට අයත් නොවන්නේ,

(1) කාලය. (2) ලෝකය.
(3) දීපය. (4) මව.

3. සිදුහත් බෝසතාණෝ "මව් කුස පිළිසිඳීම පිළිබඳ සිහිනය" මහාමායා දේවිය දුටුවේ,

(1) වෙසක් පෝයදාකය. (2) පොසොන් පෝයදාකය.
(3) ඇසළ පෝයදාකය. (4) දුරුතු පෝයදාකය.

4. "අග්ගෝ හමස්මි ලෝකස්ස" මෙහි සරල තේරුම,

(1) මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි යන්නයි. (2) මම ලොවට අග්‍ර වෙමි යන්නයි.
(3) මම ලොවට තිලක යන්නයි. (4) මේ මාගේ අවසන් උපත යන්නයි.

5. මහාමායා දේවිය කලුරිය කළ පසු සිදුහත් කුමරු හදා වඩා ගත්තේ.

(1) සුජාතා සිටු දේවියයි. (2) කෝසල දේවියයි.
(3) මහා ප්‍රජාපති ගෝතමී දේවියයි. (4) බන්ධුල මල්ලිකා දේවියයි.

6. පිය රජතුමා සිදුහත් කුමරුට දෙවන වරට වැන්දේ.

(1) අසිත තවුසා කුමරුට වැන්ද අවස්ථාවේදී ය. (2) මව කලුරිය කළ අවස්ථාවේ දී ය.
(3) විවාහ මංගල අවසථාවේදී ය. (4) වප් මගුල් උත්සව අවස්ථාවේදී ය.

7. ගිහි ගෙයින් නික්ම යන විට සිදුහත් කුමරුගේ වයස අවුරුදු.

(1) 16 කි. (2) 20 කි.
(3) 25 කි. (4) 29 කි.

8. දුෂ්කර ක්‍රියාව අත්හළ බොධිසත්වයෝ අනුගමනය කළ ප්‍රතිපත්තිය නම්.

(1) දුෂ්කර තපස් ව්‍රත අනුගමනය කිරීම. (2) සිරුරට අධිකව සැප ලබා දීම.
(3) මැදුම් පිළිවෙත අනුගමනය කිරීම. (4) පිඬුසිගා වැඩීම අත් හැරීම.

9. පන්සලට ගිය පසු වන්දනාමාන කිරීමේ දී දෙවනුව වන්දනා කළ යුත්තේ.

(1) වෙහෙර වහන්සේට ය. (2) බෝධීන් වහන්සේට ය.
(3) පිළිම වහන්සේට ය. (4) ජාතක පොත් වහන්සේට ය.

10. ඉතිපි සෝ භගවා අරහං............ විජ්ජාචරණ යනාදී ගාථා පාඨයෙහි හිස්තැනට නියමිත බුදුගුණය වන්නේ,

(1) සුගතෝ යන්නයි (2) ලෝකවිදූ යන්නයි
(3) සම්මා සම්බුද්ධෝ යන්නයි (4) අනුත්තරෝ යන්නයි

11. යස්ස මූලේ නිසින්නෝව ......මෙම ගාථාව සජ්ඣායනා කරමින් වන්දනා කරන්නේ,

(1) බෝධීන් වහන්සේ ය. (2) පිළිම වහන්සේ ය.
(3) චෛත්‍ය රාජයාණන් වහන්සේ ය. (4) සංඝයා වහන්සේ ය.

12. පැන් පූජා කරන ගාථාවේ මුල් පද පේළිය වන්නේ,

(1) පූජේමි බුද්ධං කුසුමේනනේන යන්නයි (2) අධිවාසේතු නෝ භන්තේ යන්නයි
(3) කායේන වාචා චිත්තේන යන්නයි (4) සුගන්ධං සීතලං කප්පං...යන්නයි

13. බුදු දහම අනුව උපාසකයෙකු වීමේ මූලික පියවර වන්නේ,

(1) බුදුන් සරණ යාම (2) දහම් සරණ යාම
(3) තෙරුවන් සරණ යාම (4) සඟ සරණ යාම

14. දියුණුවේ දොරටු සඳහන් වන්නේ,

(1) අත්ථස්සද්වාර ජාතකයේ ය. (2) උම්මග්ග ජාතකයේ ය.
(3) වෙස්සන්තර ජාතකයේ ය. (4) ස්වර්ණ හංස ජාතකයේ ය.

15. "නිදාගන්නවා" යන වචනයට අදාළ ශාසනික වචනය වන්නේ,

(1) වළඳනවා යන්නයි. (2) පැන් පහසු වෙනවා යන්නයි.
(3) වඩිනවා යන්නයි. (4) සැතපෙනවා යන්නයි.

16. සීල ශික්ෂාවට අයත් නොවන අංගය තෝරන්න.

(1) සම්මා වාචා (2) සම්මා සංකප්ප
(3) සම්මා ආජීව (4) සම්මා කම්මන්ත

17. ජීවත් වීමේදී අනුගමනය කළ යුතු ජීවන ක්‍රමයක් ලෙස බුදු දහම අනුමත කරන්නේ.

(1) මස් වෙළඳාම (2) මාලු වෙළඳාම
(3) සුරතල් සතුන් වෙළඳාම (4) රාජ්‍ය සේවය

18. නුදුන් දෙයක් සොර සිතින් නොගනිමි ...... මෙහි දැක්වෙන්නේ පන්සිල් වල,

(1) පළමු සිල්පදයයි (2) දෙවන සිල්පදයයි
(3) තෙවන සිල්පදයයි (4) සිව්වන සිල්පදයයි

19. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනු

(1) සතර අගතියයි (2) සතර බ්‍රහ්ම විහරණයි
(3) සතර සති පට්ඨානයයි (4) චතුරාර්ය සත්‍යයි

20. ජාතික කොඩියෙහි සතර බ්‍රහ්ම විහරණ පෙන්නුම් කරන්නේ,

(1) කහපාට සිංහයාගෙනි (2) අසිපතිනි
(3) කහපාට තීරුවෙනි (4) බෝපත් සතරෙනි

(ලකුණු 2 x 20 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - II

නම / විභාග අංකය :-.............................................................

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1) කෙටි පිළිතුරු ලියන්න.

i. සිදුහත් කුමරුට ශිල්ප ඉගැන් වූ ගුරුවරයා නම් කරන්න.
ii. කුඩා සිදුහත් කුමරු උගත් ශිල්ප දෙකක් නම් කරන්න.
iii. සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති මොනවාද?
iv. නිබ්බුතා නූන සා මාතා .... මෙය සම්පූර්ණ කරන්න.
v. පස්වග තවුසන් නම් කරන්න. (ලකුණු 4 x 5)

2)

i. සිදුහත් තවුසාගේ ගුරුවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු -5)
ii. සිදුහත් බෝසතාණෝ බුද්ධත්වයට පෙර උපදවා ගත් ත්‍රිවිද්‍යා මොනවාද? (ලකුණු -3)
iii. සිදුහත් කුමරුගේ චරිතයෙන් ශිෂ්‍යයෙකුගේ චරිතයට ගත හැකි ආදර්ශ විස්තර කරන්න. (ලකුණු -5)

3)

i. මෛත්‍රී භාවනාව සඳහා පිරිමි සහ ගැහැණු හිඳ ගත යුතු පර්යංක දෙක පිළිවෙලින් ලියන්න. (ලකුණු -2)
ii. මෛත්‍රී භාවනාව වැඩීමෙන් ලැබෙන ආනිසංස වලින් 3 ලියන්න (ලකුණු -3)
iii. මෛත්‍රී භාවනාව වඩන ආකාරය ලියන්න. (ලකුණු -5)

4)

i. බුදු දහම අනුව සංසාරගත ජීවිතයේ දී ප්‍රීතිමත්ව හා සාමකාමීව ජීවත් වීමට හා සසර දුකින් අත් මිදීමට පෙන්වා දී ඇති මාර්ගය කුමක්ද? (ලකුණු -2)
ii. ආර්ය මාර්ගය බෙදන කොටස් තුන නම් කරන්න. (ලකුණු -3)
iii. සම්මා වාචා යන්න පැහැදිලි කරන්න. (ලකුණු -5)

5)

i. පන්සිල් වල පළමු සිල් පදය ලියන්න. (ලකුණු -2)
ii. සීලයේ ප්‍රභේද දෙකකි.එනම් චාරිත්‍ර හා වාරිත්‍ර යනුවෙනි.එහි සමාදානය යන්න විස්තර කරන්න. (ලකුණු-3)
iii. ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය යනු කුමක්දැයි විස්තර කරන්න. (ලකුණු -5)

6)

i. දෙමාපියන් හා දූ දරුවන් අතර පැවතිය යුතු සබඳතාව පෙන්වා දෙමින් බුදු රජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය කුමක් ද? (ලකුණු -2)
ii. ඉහත (1) සූත්‍රයේ දැක්වෙන දරුවන් විසින් දෙමාපියන්ට කළ යුතු යුතුකම් 3ක් ලියන්න. (ලකුණු-3)
iii. එම එක් යුතුකමක් ඉටු කරන ආකාරය ලියන්න. (ලකුණු -5)

7) කොටස් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න. එක් කොටසකට ලකුණු 5කි.

i. දියුණුවේ දොරටු

ii. රාහුල හාමුදුරුවෝ

iii. ජාතික ගීය

iv. නව අරහාදී බුදු ගුණ පාඨය ලියන්න.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

නම / විභාග අංකය :-..............................................................

### I - පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1 - (1) | 6 - (4) | 11 - (1) | 16 - (2) |
| 2 - (2) | 7 - (4) | 12 - (4) | 17 - (4) |
| 3 - (3) | 8 - (3) | 13 - (3) | 18 - (2) |
| 4 - (2) | 9 - (2) | 14 - (1) | 19 - (2) |
| 5 - (3) | 10 - (3) | 15 - (4) | 20 - (4) |

### II - පත්‍රය.

1)

i. සර්වමිත්‍ර/විශ්වමිත්‍ර බමුණු පඩිවරයා.

ii. දුණු, කඩු, ඇතු පිට යාම, අශ්වයා පිට යාම සහ ක්‍රීඩා.

iii. මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිනියක්, පැවිදි රුවක්.

iv. නිබ්බුතා නූන සා මාතා - නිබ්බුතා නූන සෝ පිතා.
නිබ්බුතා නූන සා නාරී - යස්සායං ඊදිසෝ පති.

v. කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම අස්සජි.

(ලකුණු 4 x 5 = 20)

2)

i. භග්ගව, ආලාර කාලාම, උද්දකරාම පුත්ත.

ii. පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූප පාත ඥාණය, ආසවක්ඛය ඥාණය.

iii. හොඳින් ඉගෙනීම, විමසා බලා ක්‍රියා කිරීම, ගුරු ගෞරවය, යහලු කුමාරවරු සමඟ සමගියෙන් කටයුතු කිරීම, යනා දී කරුණු සලකා බලා ලකුණු දෙන්න.උගත් ශිල්ප අන් අය පීඩාවට පත් කිරීමට යොදා නොගැනීම.

3)

i. පිරිමි - බද්ධ පර්යංකය, ගැහැණු - අර්ධ පර්යංකය.

ii. ආනිසංස 11 න් 3ක් ලියා ඇත්නම් ලකුණු 3 දෙන්න.

iii. භාවනාව සඳහා තෝරාගත් ස්ථානය පවිත්‍ර කර ගැනීම.
අදාළ ඉරියව්වට පැමිණීම.
නමස්කාර පාඨය කියවා තෙරුවන් නැමදීම.
ඉන්පසු පිළිවෙලින් පියවරින් පියවර භාවනාව වැඩීම. (මම නිදුක් වෙත්වා! නීරෝගී වෙත්වා! සුවපත් වෙත්වා! මාගේ මව් පිය, ගුරුවරු, හිතමිතුරන්ද, මැදහත් අයද අහිතවත් අයද නිදුක් වෙත්වා! නීරෝගී වෙත්වා! සුවපත් වෙත්වා! යනාදී ආකාරයට ලියා ඇති පිළිතුරු වලට ලකුණු 5 දෙන්න.

4)

i. ආර්ය අෂ්ටාංගික මාර්ගය/ මැදුම් පිළිවෙත/ මධ්‍යම ප්‍රතිපදාව.

ii. සීල, සමාධි, ප්‍රඥා

iii. සම්මා වාචා යනු යහපත් වචන කතා කිරීමයි, බොරුවෙන්, කේළමෙන්, හිස්වචනයෙන් හා එරුස වචනයෙන් තොර වචන යහපත් වචනයයි, එනම් සත්‍ය වචන කීම, අනුන් අතර සමගියට හේතුවන දේ කථා කිරීම, වැඩදායී වචන කතා කිරීම හා කනට මිහිරි වචන කථා කිරීම යන කරුණු සහිත වචන සම්මා වාචා නම් වේ.

5)

i. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි. (පාලියෙන් ලිවිය යුතුය).

ii. සමාදානය යනු සිල්පදය ආරක්ෂා කිරීමේදී අප සැලකිලිමත් විය යුතු කරුණු තුනකි.
එනම්,
   i. තමා යහපතෙහි යෙදී ම.
   ii. අන් අය ද යහපත් ක්‍රියාවන්ට යොමු කිරීම.
   iii. අනුන් කරන යහපත් ක්‍රියා අගය කිරීම.

iii. පන්සිල් සුරැකීමේ දී සෑම සිල් පදයක් ම අංශ තුනකින් ආරක්ෂා කළ යුතුයි. එය ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය නම් වේ.
   i. තමා වරදින් වැළකීම.
   ii. අන් අය ලවා වැරදි නොකර වීම.
   iii. අන් අය කරන වැරදි අනුමත නොකිරීම. (වැරදි කිරීමට අනුබල නොදීම)

6)

i. සිගාලෝවාද සූත්‍රය.

ii.
- ආහාරපාන සපයා දීම.
- අවශ්‍යතා ඉටුකරදීම.
- පරම්පරාව රැක ගැනීම.
- පරපුරෙන් පැවරී ඇති දේපළ ආරක්ෂා කිරීම.
- දෙමාපියන් මියගිය පසු පින්කම් කොට පින් අනුමෝදන් කිරීම. (මින් තුනක්)

iii. පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න.

7)

i. අත්ථස්සද්වාර ජාතකයේ දැක්වෙන නිරෝගී බව, සිල්වත් බව, වැඩිහිටියන්ගේ උපදෙස් ලැබීම, හොඳ ඉගෙනීමක් තිබීම, දැහැමිව ජීවත් වීම, කම්මැලි නොවීම මින් පහක් ඇත්නම් ලකුණු පහක් දෙන්න.

ii. රාහුල හාමුදුරුවන් පිළිබඳ ලියා ඇති කරුණු වල වැදගත්කම සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙන්න.

iii. රටක අනන්‍යතාවය ප්‍රකට කෙරෙන සංකේතයක් බව,
ආනන්ද සමරකෝන් මහතා රචනා කළ බව,
මාතෘ භූමියේ සෞන්දර්යය හා සෞභාග්‍යය ජාතික ගීයෙන් පැවසෙන බව හා ගීතය ගායනා කිරීමේදී සිටිය යුතු ආකාරය වැනි කරුණු සහිත පිළිතුරු වලට උපරිම ලකුණු දෙන්න.

iv. බුදු ගුණ පාඨය නිවැරදිව ලියා ඇති පිළිතුරු වලට අක්ෂර වින්‍යාසය නොසලකා ලකුණු දෙන්න.